**මොරටුව මහා නගර සභාව - 2021**

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

1.1 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මොරටුව මහා නගර සභාවේ 2021දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මොරටුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මහා නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව මහා නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මහා නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ මහා නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මහා නගර සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

**-----------------------------------------------**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මහා නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**-----------------------**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ 2018 දෙසැම්බර් 31 දිනැති හා අංක 4/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ උපදෙස් පරිදි, 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ආයතනය සතු සියලු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කළ යුතු බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 01 දිනැති හා අංක LGD/10A/4/න.ගි/ 2019 දරන ලිපිය අනුව දන්වා ඇතත් මහා නගර සභාව විසින් 2021 වර්ෂයේ ද වත්කම් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. ඒ හේතුවෙන් දේපළ, පිරියත හා උපකරණ සඳහා 2021 වර්ෂයේ ද ක්ෂයවීම් ගිණුම්ගත කර නොතිබුණි | කොවිඩ් 19 වසංගතය හේතුවෙන් රටේ පැවති තත්වය නිසා සේවකයින් කඩින් කඩ සේවයට කැඳවීම් නිසා සියළු ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට නොහැකි වූ අතර ඉදිරියේදී වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරන අතර ක්ෂයවීම් ද ගිණුම්ගත කරන බවද දන්වා සිටිමි. | සියළු ස්ථාවර වත්කම් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ප්‍රත්‍යාගණනය කර ක්ෂයවීම්ද ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට පවතින දේපළ, පිරියත හා උපකරණ ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය සංචිත හා වෙන් කිරීමේ ගිණුමට මාරු කර, වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමෙන් අනතුරුව | 2021 වර්ෂයේ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට නොහැකි වූ බැවින් ප්‍රත්‍යාගණන සංචිත ගිණුමක් ඇති කිරීමට නොහැකි වූ බව දන්වා සිටින අතර ඉදිරියේදී ප්‍රත්‍යාගණන සංචිත ගිණුමක් ඇති කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව නව ගිණුම් ක්‍රමයට අනුව ගනුදෙනු ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නව දේපළ, පිරියත හා උපකරණ ගිණුමක් සහ ප්‍රත්‍යාගණන සංචිත ගිණුමක් ඇති කළ යුතුය. එහෙත් මෙම නගර සභාවේ දේපළ 2021 දෙසැම්බර් 31 දිනට ද ප්‍රත්‍යාගණනය නොකිරීම හේතුවෙන් මෙම නව ගිණුම්ගත කිරීම සිදු කර නොතිබුණි. | | |
| (ඈ) | ඉකුත් වර්ෂයට අදාළ රු.82,983,929 ක ප්‍රාග්ධන ප්‍රදාන වටිනාකමින් කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ක්ෂය අනුපාතයට සමාන ප්‍රතිශතයක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් වන පැවරුම් යටතේ දැක්විය යුතු වුවත් වත්කම් ලේඛනගත නොකිරීම හා නව ගිණුම් ක්‍රමයට අනුව කටයුතු නොකිරීමත් නිසා ප්‍රාග්ධන ප්‍රදානවලට අදාළ ගැළපුම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙය 2021 වර්ෂයට අදාළ නොවේ. මෙම මුදල රු.82,983,929 පුනරාවර්තන වියදම් සඳහා පළාත් සභාවෙන් ලද මුදලක් (මාර්ග අලුත්වැඩියා සඳහා) වන බැවින් ගිණුම්කරණ ප්‍රමිත අනුව විස්තිර්ණ ආදායම් ප්‍රකාශනයේ සටහන් අංක 05 යටතේ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දක්වා නොමැත. | ප්‍රග්ධන ආදායම් වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | මධ්‍යම වෙළඳපල කඩ කුලි ශේෂයෙන් හා පොදු වෙළඳපල කඩ කුලි ශේෂයෙන් සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙලින් රු.301,473 ක් හා රු.130,084 ක් කපාහැර තිබුණ ද එම ශේෂ නිරවුල් නොකිරීම නිසා හුවමාරු ගණුදෙනු වලින් ලැබිය යුතු දෑ යටතේ රු.431,557 ක් වැඩියෙන් දක්වා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ගනුදෙනු නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයන් 02 ට අදාල ශේෂයන් ඒවාට අදාළ උපලේඛනයන් සමඟ සැසඳීමේදී මූල්‍ය ප්‍රකාශනවල රු.2,712,048 ක් වැඩියෙන් සහ රු.22,973,032 ක් අඩුවෙන් දක්වා තිබුණි. | සේවක ණය ගිණුම්වල ශේෂ හා උපලේඛණ අනුව ශේෂ අතර පවතින වෙනස හඳුනා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතින අතර වෙනස හඳුනාගෙන ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. | වෙනස්කම් හඳුනාගෙන ශේෂ නිරවුල් කළ යුතුවේ. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| එකතුව රු.84,802,768 ක් වූ ගිණුම් විෂයන් 09 ක් සඳහා විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරිම හේතුවෙන් විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කළ නොහැකි විය. | 2020 වර්ෂයේ ආපසස්සට වසර කිහිපයක හිඟ ලේඛන පරික්ෂාව කර ඇතත් ඒ දක්වා මෙම හිගය නිරීක්ෂණය නොවිය. එබැවින් තවදුරටත් හිඟ ලේඛන පරික්ෂා කළ යුතුය. | ශේෂය තහවුරුව සඳහා අවශ්‍ය උපලේඛණ ඉදිරිපත් කළ යුතුවේ. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| (අ) | මුදල් රෙගුලාසි 104(3) හා (4) | හානියක් සිදු වී දින 07 කට වඩා ගතවන්නේ නම් ප්‍රාරම්භක වාර්තාවක් ද හානිය සිදු වී මාස 03 ක් ගතවීමට ප්‍රථම පූර්ණ වාර්තාවක් ද ඉදිරිපත් කළ යුතු වුවත් සභාව සතු වාහන අනතුරු සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි 104 (3) හා (4) ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | මුදල් රෙගුලාසි 128 | නිසි මූල්‍ය පරිපාලනයක් පවත්වා නොගැනීම නිසා 2021 වර්ෂය තුළ ලබාගත් අයිරා පහසුකම් සඳහා රු.1,296,602 ක අයිරා පොලියක් සභාව විසින් ගෙවා තිබුණි. | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 206 (අ) වගන්තිය ප්‍රකාරව බැංකු අයිරා පහසුකම් ලබා ගෙන ඇති අතර ලබාගත් බැංකු අයිරා පහසුකමට පොළිය ගෙවීමට සිදුවී ඇත. | මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මුදල් රෙගුලාසි 156 | 2003 සිට 2015 වර්ෂය දක්වා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට වාර්තා සහ දායක මුදල් යැවීම ප්‍රමාදවීම මත රු.1,549,200 ක අධිභාර ගෙවීමේ වගකීමක් සභාවට පැන නැගී තිබූ අතර 2015 සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී සභාව විසින් ගෙවන ලද රු.1,088,565 ක් විය. මේ සඳහා වගකිව යුතු පාර්ශව සම්බන්ධයෙන් විධිමත් පියවර ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ඈ) | | අංක 1329 මුදල් දරන සැළසුම් අනුමත කිරීම සම්බන්ධයෙන් සභාවට එරෙහිව පවරන ලද නඩුවේදී 2018 ජූලි 20 වන දින ලබා දුන් අධිකරණ නියෝගය අනුව පැමිණිලිකරු වෙත වන්දි මුදල් සහ නඩු ගාස්තු වශයෙන් සභාව විසින් ගෙවූ රු.11,602,318 ක මුදල් ඊට වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | මීට අදාළව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය විසින් පරීක්ෂණ කටයුත්තක් සිදු කරන ලද අතර එහි ප්‍රතිඵල මේ දක්වා වාර්තා කර නොමැත. | |
| (ඉ) | මුදල් රෙගුලාසි 756 | රු.964,975 ක් වටිනා ඉන්ධන තොග සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉන්ධන තොග සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණයක් ඉදිරි වර්ෂ වලදි සිදු කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි 756 ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

2. **මූල්‍ය සමාලෝචනය**

**-----------------------**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

**----------------**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.136,192,585 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.24,003,920 ක් විය.

2.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**-----------------------------------------**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| (i) | මහා නගර සභා ආඥා පනතේ 252(1)(අ) සහ (ආ) වගන්ති ප්‍රකාරව වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු නොකිරීම නිසා 2021 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.257,771,441 ක් වූ අතර ඒ තුළ හිඟ වරිපනම් වටිනාකම රු.50,000 ඉක්ම වූ වරිපනම් ඒකක 361 කින් අයවිය යුතු වටිනාකම රු.91,369,427 ක් විය. | මොරටුව මහා නගර සභා සීමාව තුළ ඇති රජයේ දේපළ මෙන්ම බදු සහන ලබා දිය යුතු දේපළ වල වරිපනම් බදු හිඟයන්ද මෙම හිඟ වරිපනම් ශේෂය තුළ පවති. දැනට බදු සහන කමිටු ක්‍රියාත්මක අතර එමගින් හැකි දේපළ සඳහා බදු සහන ලබා දීමට කටයුතු කරන බැවින් එම හිඟ මුදල් අඩු වනු ඇත. රාජ්‍ය දේපළ සඳහා වන හිඟ මුදල් දිගුකාලිනව අයකරගත නොහැකි තත්වයක පවති. එහෙත් තවදුරටත් විධිමත් පරිදි හිඟ මුදල් අයකර ගැනීමේ ඉදිරි ක්‍රියාමාර්ග ඉටුකිරීමේ කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | 2020 දෙසැම්බර් 31 වන දිනට හිඟ වරිපනම් ශේෂය රු.222,516,941 ක් වුවද ඉන් රු.50,817,283 ක් හෙවත් සියයට 23 ක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන තිබුණද රු.171,699,658 ක් හෙවත් සියයට 77 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | රාජ්‍ය දේපළ සඳහා වන හිඟ මුදල් මෙන්ම වසා දමන ලද ව්‍යාපාරික ස්ථාන සඳහා වන හිඟ වරිපනම් බදු මුදල්ද මෙම හිඟ මුදලට ඇතුළත්ව ඇත. තවද බදු සහන ලබා දිය යුතු දේපළ වල වරිපනම් බදු හිඟයන්ද මෙම හිඟ වරිපනම් ශේෂය තුළ පවති. දැනට බදු සහන ලබාදිමේදී එම හිඟ මුදල් අඩු වනු ඇත. | -එම- |

| | | | |
|---|---|---|---|
| | | එමෙන්ම රාජ්‍ය දේපළ සඳහා වන හිඟ මුදල් දිගුකාලීනව අයකරගත නොහැකි තත්වයක පවතී. එහෙත් තවදුරටත් එකී හිඟ මුදල් අය කිරීම සඳහා අදාළ රාජ්‍ය ආයතන දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම සිදු කරමින් පවතී. තවද හිඟ මුදල් අයකර ගැනීම සඳහා වරිපනම් බදු එකතු කිරීමේ ජංගම සේවාවන්ද, විනිග්‍රහන බලපත්‍ර නිකුත් කිරීම මගින් දේපළ තහනම් කිරීමේ ක්‍රියාමාර්ගයන්ද ගැනීම සිදු කරමින් පවතින අතර ඒ අනුව හිඟ මුදල් අය කර ගැනීමට හැකි වනු ඇත. | |
| (ආ) | කුලී<br>------- | | |
| (i) | මහා නගර සභා ආඥා පනතේ (252 අධිකාරිය) 254(අ) 1 සහ 2 වන වගන්ති අනුව මහා නගර සභාවට අයවිය යුතු ගෙවීම් අයකරගත යුතු වුවත් දිර්ඝ කාලින බදු දෙන දේපළ 181 කින් 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ ශේෂය රු.3,124,678 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2020 හා 2021 වසර සඳහා කොවිඩ් සහන යටතේ කපා හැරීමට නියමිත මුදල රු.522,679 කි. ලේඛන වලින් කපා හැරීමට නියමිත හිඟ මුදල රු.457,453 කි. වාරික වශයෙන් අයකර ගැනීමට කටයුතු කර ඇති මුදල රු.60,000 කි. මේ වන විට 2022 වසරේ දී හිඟයෙන් අය කරගෙන ඇති මුදල රු.294,882 කි. ඒ අනුව ඉතිරි මුදල වන රු.1,358,105 ක් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | සභාව සතු බදු දේපළ 250 න් දේපළ 32 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | සභාව සතු බදු දෙන දේපළ 258 න් මධ්‍යම වෙළඳපොලේ කඩ කාමර 08 ක් බදු නොදීමට 2021.12.02 දිනැති මාසික සභා රැස්වීමේ දී තීරණය කර ඇත. ගිවිසුම්ගත වී තක්සේරුවක් ලබාගෙන ගිවිසුම්ගත වීමට කටයුතු කරනු ලැබේ. | බදු ගිවිසුම්ගත වීමට කටයුතු කළ යුතුය. |

2.3 **අධිභාර**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහා නගර සභා ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන්ට එරෙහිව විගණකාධිපතිවරයා විසින් ඉකුත් වර්ෂයන් තුළ පැන වූ අධිභාර වෙනුවෙන් 2021 දෙසැම්බර් 31 දිනට රු.760,173 ක් අයකර ගැනීමට තිබුණි. | අදහස් දක්වා නොමැත. | අධිභාර ශේෂ පියවීමට කටයුතු කළ යුතුවේ. |

3 **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් අංශයේ පරිගණක සේවයට අනුයුක්ත කර ඇති සේවකයන් විසින් පොදු මුරපදය (Common Pass Word) භාවිතා කරමින් 2018 වර්ෂයේ අවස්ථා 10 කදී රු.105,893 ක් වටිනා බිල්පත් අවලංගුකර වරිපනම් බදු අක්‍රමිකතාවයක් සිදුකර තිබුණි. මාණ්ඩලික නිලධාරියෙකු සතුව පැවතිය යුතු රහස් මුර පදයද (Secret Pass Word ) භාවිතා කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විධිමත් පරික්ෂණයක් පවත්වා අලාභය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | පරීක්ෂණ කඩිනමින් කර වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභ අයකළ යුතුවේ. |

3.2 **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එන්ජිම අළුත්වැඩියා නොකිරීම නිසා වාහන 14 ක් ධාවනයෙන් ඉවත් කර තිබූ අතර එම වාහන දිර්ඝ කාලයක සිට අක්‍රියව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | වාහන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මොරටුව මහා නගර සභාවේ අධීක්ෂණය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය විසින් භූගත රථ ගාලක් හා උන්නත මහජන උද්‍යානයක් ලෙස සංවර්ධනය කරන ලද වීර පුරන් අප්පු උද්‍යානයේ වැඩ කටයුතු අවසන් කර 2020 මාර්තු 13 දින සභාව වෙත ලිඛිතව භාරදී තිබුණද 2021 දෙසැම්බර් 31 වන විටත් ප්‍රයෝජනයට නොගෙන නිශ්ක්‍රීයව පැවතුණි. | දැනට මොරටුව මධ්‍ය වෙළඳපොල පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල අබලන් තත්වයේ පවතින බැවින් එය නවීකරණ කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නව ගොඩනැගිල්ලක් ස්ථාපනය කිරීම සඳහා සැළසුම් සකස් කර ඇති අතර, එම ගොඩනැගිල්ල ඉදිකිරීමේදී දැනට මධ්‍යම වෙළඳපොලේ පවතින කඩ කාමර වීරපුරන් අප්පු මහජන උද්‍යානයේ භූගත රථ ගාලේ තාවකාලිකව ස්ථාපනය කිරීමට යෝජනා වී ඇති හෙයින් එම උද්‍යානය මහජනතාවට විවෘත කිරීමට නොහැකි වී ඇත. | නිශ්ක්‍රීය වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | ලුනාව තානායම පිහිටා තිබූ සභාව සතු හෙක්ටයාර් 0.7063 ක් විශාල ඉඩම මහල් නිවාස ව්‍යාපෘතියක් සඳහා නිවාස සංවර්ධන අධිකාරිය විසින් පවරාගෙන තිබුණ ද 2021 දෙසැම්බර් 31 දින විටත් අධිකාරිය වෙතින් සභාව වෙත වන්දි මුදල් අයවී නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලැබිය යුතු වන්දි මුදල් ලබා ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

--------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කසළ කළමනාකරණය වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට සමාලෝචිත වර්ෂය සඳහා ගෙවිය යුතු රු.20,405,393 කින් කිසිදු මුදලක් ගෙවා නොතිබුණු අතර ඒ අනුව 2021 දෙසැම්බර් 31 දිනට සමස්ථ හිඟ ශේෂය රු.56,839,195 ක් විය. | අදහස් දක්වා නොමැත. | ගෙවිය යුතු මුදල් ගෙවීමට කටයුතු කළ යුතුවේ. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ව්‍යාපෘති අවශ්‍යතා වෙනුවෙන් 2014 මැයි 29 දින බඳවාගෙන තිබූ සේවකයන් 83 දෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂය තුළදී වැටුප් හා දීමනා ලෙස රු.23,464,948 ක් ගෙවා තිබුණු අතර එම තනතුරු අනුමත කාර්ය මණ්ඩලය තුළ නොපැවතීම හේතුවෙන් වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට නොහැකි වී සභාවේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | සභාව සතු දේපළ හා ගොඩනැගිලිවල ආරක්ෂාව වෙනුවෙන් ආරක්ෂක නියාමකවරුන්ද ප්‍රදේශයේ ජනතාවගේ සෞඛ්‍ය නගා සිටුවීම පෙරදැරිව ක්‍රියාත්මක ලූනාව කලපු හා ඩෙංගු ව්‍යාපෘතිය, වෛද්‍ය රසායනාගාර ව්‍යාපෘති, තක්සේරු ප්‍රතිශෝධන ව්‍යාපෘතිය යනාදිය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අමතර ව්‍යාපෘති පදනමින් බඳවාගෙන ඇති අතර ව්‍යාපෘති බඳවාගැනීම් සඳහා රජය මඟින් වැටුප් ප්‍රතිපූර්ණය නොකරන බැවින් සභාව මඟින් වැටුප් ගෙවීමක් කර ඇත. | පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය මත බඳවා ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | වැඩ තහනම් කල හා සේවය හැරගිය නිළධාරීන් 31 දෙනෙකුගෙන් රු.843,324 ක් ද මියගිය හා විශ්‍රාම ගිය නිළධාරීන් 14 දෙනෙකුගෙන් රු.390,228 ක්ද වශයෙන් එකතුව රු.1,233,552 ක ණය ශේෂ සමාලෝචිත වර්ෂය තුළදී අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | වැඩ තහනම් කළ, සේවය හැරගිය හා මියගිය නිළධාරීන්ගෙන් හා විශ්‍රාමගිය නිළධාරීන් 7 දෙනාගේ ණය ශේෂයන් අය කර ගැනීමට ඉදිරි කටයුතු සිදුකිරීමට කටයුතු කරමින් පවතී . | හිඟ ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | අක්‍රීය ණය ශේෂ ලේඛනයේ ඇතුළත් නිළධාරීන් 107 දෙනෙකුගෙන් අයවිය යුතු වූ රු.1,567,846 ක ණය ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අක්‍රිය ණය ලේඛණයේ සඳහන් සේවකයන්/ නිලධාරීන් 107 දෙනාගෙන් අය විය යුතු ණය ශේෂ අයකර ගැනීම සඳහා ලේඛනාගාරයෙන් අවශ්‍ය ලිපිගොනු සොයා බලා ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවති. | අක්‍රිය ණය ශේෂ නිරවුල් කළ යුතුවේ. |
| (ඈ) | සේවක ණය අය කිරිමේදී නිළධාරින් 14 දෙනෙකුගෙන් රු.99,486 ක මුදලක් වැඩිපුර අයකර තිබුණි. | සේවක ණය අය කිරීමේදී නිලධාරීන් 14 දෙනෙකුගෙන් වැඩිපුර අය වී ඇති මුදල් නැවත ගෙවීම වෙනුවෙන් ඔවුන්ගෙන් තොරතුරු ඉල්ලීම් කර ආයතන අංශය වෙතින් ලබාගෙන ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමින් පවති. | වැඩිපුර අයකළ මුදල ගෙවීමට කටයුතු කළ යුතුවේ. |

## 3.5 වාහන උපයෝජනය

------------------------

| විගණන නිරීක්ෂණය<br>------------------------ | සභාවේ අදහස් දැක්වීම<br>--------------------------- | නිර්දේශය<br>----------- |
| --- | --- | --- |
| වාහන ධාවනය සඳහා ආදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතිකය ලබාගත යුතු වුවද සභාව සතු වාහන 19 ක් සඳහා ආදායම් බලපත්‍ර ද වාහන 13 ක් සඳහා රක්ෂණ සහතිකද ලබාගෙන නොතිබුණි. | වාහන ආදායම් බලපත්‍ර ලබා නොගෙන ඇති වාහන 22 ක් ලෙස සඳහන් කර ඇත. වාහන ආදායම් බලපත්‍ර ලබා නොගත් වාහන 19 කි. | ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබාගත යුතුවේ. |